# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.15 පැය 2210 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/744/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. වෙඩි තැබීමක් - ගම්පහ පොලිස් වසම.**

2025.04.15 වන අද දින රාත්‍රී කාලයේ ගම්පහ පොලිස් වසමේ ගම්පහ නගරයේ 200 පොදු බස් නැවතුම්පොල අසලදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් ධාවනය වෙමින් තිබූ කුඩා ලොරි රථයකට වෙඩි තබා පලා ගොස් ඇති බවට ගම්පහ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

වෙඩි තැබීමේදී කුඩා ලොරි රථයේ ගමන් කළ පුද්ගලයින් දෙදෙනෙකු ලොරි රථයෙන් බැස අසල තිබූ වෙළෙඳසැලකට දිව ගොස් ඇති අතර ඔවුනට තුවාල සිදු වී නොමැත. වෙඩි වැදීමෙන් වෑන් රථයට පමණක් අලාභ සිදුව ඇති අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. පලා ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගම්පහ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදුකිරීමක් - මහියංගනය පොලිස් වසම.**

2025.04.15 වන අද දින සවස් කාලයේ මහියංගනය පොලිස් වසමේ ගෙවල් 20 ප්‍රදේශයේදී වෙඩි තැබීමක් හේතුවෙන් පුද්ගලයෙකු තුවාල ලබා මහියංගනය රෝහලේ ප්‍රතිකාර ලබන බවට මහියංගනය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 51 ක් වන දඹරාව, මහියංගනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙපිරිසක් අතර ඇතිව තිබූ ආරවුලක් දුරදිග යාමෙන් එක් පාශර්වයක පුද්ගලයෙකු විසින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට දැනට සිදුකරනු ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. සිද්ධියට සම්බන්ධ වයස අවුරුදු 55 ක් වන මහියංගනය ප්‍රදේශයේ පදිංචි සැකකරු වෙඩි තැබීමට උපයෝගී කරගන්නා ලද ටී56 වගර්යේ පතොරම් යෙදිය හැකි මෙරට නිෂ්පාදිත ගිනි අවියද සමඟ අත්අඩංගුවට ගෙන ඇත. මහියංගනය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.**

2025.04.15 වන අද දින උදෑසන කාලයේ බේරුවල පොලිස් වසමේදී ආරියවංශ මාවතේදී බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන ආරියවංශ මාවත, බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බේරුවල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.

2025.04.15 වන අද දින දහවල් කාලයේ මොරගහහේන පොලිස් වසමේ පින්නකනත්ත ප්‍රදේශයේදී මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 1298 මිලි ලීටර් 250 ක් (බැරල් 07) හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 67 (බෝතල් 90), තඹ දඟරයක්, උඳුනක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන ධම්මානන්ද පෙදෙස, මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදන් වීමක් - හල්දුම්මුල්ල පොලිස් වසම.

2025.04.15 වන අද දින දහවල් කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ කලුපහණ ප්‍රදේශයේදී පුස්සැල්ල ගඟේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදන් වී ඇති බවට හල්දුම්මුල්ල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**අතුරුදන් වූ පුද්ගලයා වයස අවුරුදු 19 ක් වූ පුස්සැල්ල, කලුපහණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හල්දුම්මුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. දියේ ගිලී පුද්ගලයෙකු මිය යාමක් - පදවිය පොලිස් වසම.

2025.04.15 වන අද දින උදෑසන කාලයේ පදවිය පොලිස් වසමේ මිහිඳු මාවත අංක 03 පාලම අසල ඇළෙහි දියේ ගිලී පුද්ගලයෙකු මියගොස් ඇති බවට පදවිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ පදවි, පරාක්‍රමපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පදවිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පදවිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. දියේ ගිලී පුද්ගලයෙකු මිය යාමක් - කුච්චවේලි පොලිස් වසම.

2025.04.15 වන අද දින සවස් කාලයේ කුච්චවේලි පොලිස් වසමේ නිලාවේලි මුහුදු තීරය නැරඹීම සඳහා පැමිණි පිරිසක් පරවි දූපත අසල දිය නාමින් සිටියදී ඉන් එක් පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට කුච්චවේලි පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ කන්කසන්තුරය පාර, යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නිලාවේලි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුච්චවේලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 08. දියේ ගිලී පුද්ගලයෙකු මිය යාමක් - කාත්තන්කුඩි පොලිස් වසම.

2025.04.15 වන අද දින උදෑසන කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ පාලමුණ මුහුදු තීරයේ පුද්ගල මෘත ශරීරයක් පාවෙමින් තිබෙන බවට කාත්තන්කුඩි පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ කරබලා පාර, නව කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ 2025.04.14 වන දින පාලමුණ මුහුදු තීරයෙන් පූනච්චිමුණ ප්‍රදේශයේ ධීවර කටයුතු සඳහා මුහුදු ගොස් සිටියදී දියේ ගිලී අතුරුදන් වී ඇති අතර මෘත ශරීරය 2025.04.15 වන අද දින සොයා ගෙන ඇත

මෘත ශරීරය කාත්තන්කුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රස්නායකපුර පොලිස් ස්ථානය.

2025.04.15 වන අද දින දහවල් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ ඉහළ ඔට්ටුකුලම, ප්‍රදේශයේදී රස්නායකපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන ඉහළ ඔට්ටුකුලම, වන්නි රස්නායකපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රස්නායකපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - ඊච්චලම්පත්තුව පොලිස් වසම.

2025.04.14 වන දින සවස් කාලයේ ඊච්චලම්පත්තුව පොලිස් වසමේ ලංකා පටුන මාගර්යේ වාලේතෝට්ටම් ප්‍රදේශයේදී ලංකා පටුන දෙස සිට මුට්ටිචේන දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාගර්යේ ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු හා පසුපැදිකරු සේරුනුවර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා ත්‍රිකුණාමලය රෝහලට මාරු කර යවා ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා ඊච්චලම්පත්තුව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මූතූර් රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ වාලේතෝට්ටම්, මාවඩිචේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මූතූර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඊච්චලම්පත්තුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - කොස්ගම පොලිස් වසම.

2025.04.15 වන අද දින උදෑසන කාලයේ කොස්ගම පොලිස් වසමේ අවිස්සාවේල්ල කොළඹ ප්‍රධාන මාගර්යේ ඇස්වත්ත හන්දියේදී කොළඹ දෙස සිට ඇහැලියගොඩ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් දකුණට හැරවීමේදී පෙරළීගොස් එහි රියදුරු ඉවතට විසි වී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ පිටුපස අසුනේ ගමන් කළ ත්‍රීරෝද රථයේ රියදුරුගේ බිරිඳ හා දියණිය සුළු තුවාල ලබා ඇති අතර ත්‍රීරෝද රථයේ රියදුරු බරපතල තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ උද්‍යාන පාර, කොළඹ 05 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කොස්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - අහංගම පොලිස් වසම.

2025.04.15 වන අද දින අළුයම් කාලයේ අහංගම පොලිස් වසමේ ගාල්ල මාතර ප්‍රධාන මාගර්යේ අහංගම නගරයේදී මාතර දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ කාර් රථයක ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් මුහුණට මුහුණ ගැටී පැදිකරු යතුරුපැදිය සමග මාගර්යේ ඇද වැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා ගොන්නගහහේන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ උයන්වත්ත, මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අහංගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - දඹුල්ල පොලිස් වසම.

2025.04.14 වන දින සවස් කාලයේ දඹුල්ල පොලිස් වසමේ දඹුල්ල කණ්ඩලම මාගර්යේ කණ්ඩලම ප්‍රදේශයේදී ඇරැව්වල දෙස සිට කණ්ඩලම දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකිව මාගර්ය අසල තිබූ ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට මාරු කර යවා දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2025.04.15 වන අද දින මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ කණ්ඩලම, දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දඹුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2025.04.15 වන අද දින සවස් කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල කුලියාපිටිය මාගර්යේ දංගොල්ල හන්දියේදී නාරම්මල දෙස සිට කුලියාපිටිය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාගර්ය හරහා ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී පදික පුද්ගලයා මාගර්ය මත පෙරළී යාමෙන් අනතුරක් සිදුව

ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා නාරම්මල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ ඇටැම්පොල, හොරොම්බාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාරම්මල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාරම්මල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**